චක්‍ර ලේඛ අංක 6/96

බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1996.11.07

බස්නාහිර පළාතේ සියළුම සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

## සමුපකාර සේවක සේවිකාවන් විශ්‍රාම ගැන්වීම

ඉහත සඳහන් කාරණයට අදාලව ම විසින් නිකුත් කරන ලද 96.08.14 දින දරණ අංක 5/96 චක්‍රලේඛයට ඔබේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ පහත සඳහන් වගන්ති ඉවත් කිරීමෙන් එය සංශෝධනය කිරීමට කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද බව නියමය පරිදි දන්වමි.

" වයස අවු. 55 ඉක්මවා සේවයේ යෙදී සිටීම සඳහා වර්ෂයෙන් වර්ෂය බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් සේවා දීර්ඝයක් ලබාගත යුතු ය. එසේ සේවය දීර්ඝ කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන සියලුම අයදුම්පත් යාකොට ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර විය යුතු අතර අදාල සේවා යෝජකයා ගේ ද නිර්දේශ සහිතව එම අයදුම්පත්‍රය කොමිෂන් සභාව වෙත තුන් මසකට කලින් ඉදිරිපත් කළයුතු බව ද සැළකුව මැනවි. සේවා දිඝ කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය කොමිෂන් සභාව සතුව පවතී. "

03. තවද අංක 169/8 හා 81.12.01 දින දරණ ගැසට් පත්‍රයේ පලකර ඇති රෙගුලාසි මාලාවේ අංක 122,123,124 යන රෙගුලාසි කෙරෙහි ද ඔබේ අවධානය යොමු කරවන ලෙස කොමිෂන් සභාව මට නියම කොට ඇත. යම් කිසි සේවකයකු සිය රාජකාරි ඉටු කිරීමේදී අකාර්යක්ෂම බවක් දක්වන්නේ නම් එම රෙගුලාසි අනුව ක්‍රියා කළහැකි බව ඔබට පෙන්වා දෙන ලෙස ද කොමිෂන් සභාව මට නියම කොට ඇත. මෙම චක්‍රලේඛයේ විධිවිධාන ඔබ සමිතියේ සියලුම සේවක සේවිකාවන් ගේ දැන ගැනීමට සලස්වන්න.

මෙයට - විශ්වාසී

(පී.ඩී. චන්ද්‍රදාස)

ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:- 1. සෞඛ්‍ය, සමුපකාර හා වනිතා කටයුතු අමාත්‍යංශයේ ලේකම් - ගරු ඇමතිතුමා ගේ අවධානයට යොමු කිරීම සඳහා

2. සමුපකාර සංවර්ධන කොමසාරිස් (බ.ප.) - දැ.ගැ.පි.

3. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් (බ.ප.) - දැ.ගැ.පි.

4. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවල ලේකම්වරුන් - දැ.ගැ.පි.

5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරුන් (බ.ප.)